# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/64 - 2020 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා - 2020.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් හා වේතනවල තිරසාරභාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එම අංශ වල වැටුප්, වේතන ඇතුළු සියලු පාරිශ්‍රමික ව්‍යුහයන් සමාලෝචනය කරමින් සමස්ත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ශ්‍රමබල අවශ්‍යතාවයන් යෝග්‍ය පරිදි සපුරාලීම පහසුකරලීම සඳහා වූ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් ලබා දීම සහ සහාය වීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් තමා වෙත පැවරි ඇති බලතල ක්‍රියාත්මක කරමින් විශේෂ නියෝජිතායතනයක් ස්ථාපනය කිරීම.

01. උපාලි විජේවීර මැතිතුමා
02. චන්ද්‍රානි සේනාරත්න මැතිතුමිය
03. ගෝඨාභය ජයරත්න මැතිතුමා
04. සුජාතා කුරේ මැතිතුමිය
05. මධුරා වේහැල්ල මැතිතුමිය
06. එම්.එස්.ඩී. රනසිරි මැතිතුමා
07. වෛද්‍ය ආනන්ද හපුගොඩ මැතිතුමා
08. මහාධිකරණ විනිසුරු සංජීව සෝමරත්න මැතිතුමා
09. අජිත් නයනකාන්ත මැතිතුමා

1A - G 32042 — 392 (2020/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

10. රවී ලියනගේ මැතිතුමා
11. සනත් එදිරිවීර මැතිතුමා
12. මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා
13. ඉංජි. ආර්.එම්. අමරසේකර මැතිතුමා
14. විශ්‍රාමික මේජර් ජෙනරාල් සිරි රණවීර මැතිතුමා
15. ඩබ්ලිව්.එච්. පියදාස මැතිතුමා

වෙත,

සුභාශිංසන පෙරටුවයි!

''රට හදන සෞභාග්‍යයේ දැක්ම '' රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයට අදාළ මහජන හිතෙෂී රාජ්‍ය සේවයක් උදෙසා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා සේවා අවශ්‍යතාවය අනුව හැඩ ගැසුනු මානව සම්පත් යොදාගැනීමේ දිගු කාලීන සැලැස්මක් සකස් කිරීමට රජය අපේක්ෂා කරන හෙයින් ද, රජය විසින් සැලසුම් කර ඇති සංවර්ධන ඉලක්ක හා අභිලාෂයන් ළඟා කර ගැනීමේ ක්‍රියාවලියේදී පෞද්ගලික අංශය ද එකී ක්‍රියාවලියට දායක වීම පිළිබඳව ද සැලකිලිමත් වෙමින්, රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම ලෙස සැලසීමේත්, සංවර්ධන ක්‍රියාදාමය පහසුකරලීමේත්, අවශ්‍ය අවස්ථාවන්හි දී නියාමනය කිරීමේත් කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කළ හැකි නිපුණතාවන්ගෙන් හෙබි සේවක පිරිස් රාජ්‍ය සේවයට බඳවාගෙන ඵලදායී රාජ්‍ය සේවයක් පවත්වාගෙන යාමට හැකිවන්නා වූ වැටුප් හා වේතන සහ විවිධ දිරිකාරක ද ඇතුළත් යෝජනාවලියක් හඳුන්වාදීමට රජය අපේක්ෂා කරන හෙයින් ද,

තවද, මානව සම්පත එක් එක් ක්ෂේත්‍රයන් වෙත යොමු කරවීමේදි ආර්ථිකයේ සිදුවෙමින් පවතින ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳව සැලකිලිමත්වීමද, ජාත්‍යන්තර වශයෙන් ශ්‍රමබලකායේ ඵලදායිතාව ඉහළ නැංවීම මගින් ශ්‍රමික පිරිවැය ශ්‍රී ලංකාවට වාසිදායක ලෙස තරඟකාරී මට්ටමකට ගෙන ඒම ද අවශ්‍ය බැව් පෙනී යන හෙයින් ද,

තවද, ශ්‍රමබල අවශ්‍යතා සපුරා ගැනීමේ දී සමස්ත රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය අතරත්, රාජ්‍ය අංශය තුළ විවිධ ආයතන අතරත් අහිතකර තරඟකාරීත්වයක් ඇතිවීම වළක්වාලීම හා එකිනෙක අංශ වලට අනුපූරක වන පරිදි කටයුතු කිරීම අපේක්ෂා කරන හෙයින් ද,

තවද, ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ රාජ්‍ය අංශය සතු කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකර ලීම සඳහා සුවිශේෂී නිපුණතාවයන්ගෙන් හෙබි වෘත්තීය පිරිස් රාජ්‍ය අංශයට ආකර්ෂණය කර ගැනීමට වත්මන් ක්‍රමවේදයන් තුළ දුෂ්කරවී ඇති බැවින් ඒ සඳහා සුදුසු විශේෂ ක්‍රමවේදයන් හඳුන්වාදීමේ අවශ්‍යතාවය රජයට ඇති හෙයින් ද,

තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු කාර්යභාරය සමාලෝචනය කර විවිධ සේවාවන් සඳහා අවශ්‍ය වන සේවක සංඛ්‍යාව පිළිබඳව යළි විමසා බලා, අලුතින් තනතුරු ඇති කිරීමේදී හා අනුමත කාර්ය මණ්ඩලයන් තුල සේවකයින් සේවා අවශ්‍යතා සඳහා ඵලදායී ලෙස යෙදීමේදී අවශ්‍ය අවස්ථාවන්හි දී උපදෙස් හෝ මාර්ගෝපදේශ ලබාදීමේ අවශ්‍යතාවයක් ඇති හෙයින් ද,

තවද, රාජ්‍ය සේවයේ සේවකයන් තමන් නිරත වන කාර්ය භාරයේ ගුණාත්මකභාවය වැඩිවන අයුරින් නිරත කිරීම හා අඛණ්ඩ පුහුණු වීම් හා කුසලතා සංවර්ධන කටයුතු දියුණු කිරීම පිළිබඳ රජය ප්‍රමුඛත්වය දෙනු ලබන හෙයින් ද ,

තවද, "සෞභාග්‍යයේ දැක්ම "රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දැක්වෙන පරිදි රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවා නියුක්තියන්ගේ අභිවෘද්ධිය සඳහා වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට රජය බැඳී සිටින හෙයින් ද,

ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහි මින්මතු සඳහන් කරනු ලබන කරුණු පිළිබඳව, එනම්:

(අ) පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් පළාත් රාජ්‍ය සේවය හා සන්නද්ධ සේවාවන් ද ඇතුළු රාජ්‍ය සේවය ද, ඒකාබද්ධ අරමුදලින් වැටුප් ගෙවනු ලබන සුවිශේෂී ආයතනයන්ද, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම්, රාජ්‍ය ව්‍යවසායයන්, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු රජයේ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන ද, සියලුම නියාමන ආයතනයන්ද ඇතුළුව සමස්ත රාජ්‍ය අංශයේ සියලුම ක්ෂේත්‍රයන්හි වැටුප් හා වේතන ඇතුළුව මූල්‍යමය පාරිශ්‍රමිකයන් හා මූල්‍යමය නොවන අනෙකුත් විවිධ පහසුකම් ද අඛණ්ඩ සමාලෝචනයකට ලක්කිරීම පදනම් කරගෙන පූර්වෝක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීමට මග පැදෙන ජාතික වැටුප් හා වේතන ප්‍රතිපත්තියක් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම;

(i) රජයේ සමාජ ආර්ථික ප්‍රතිපත්ති වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමානයේ හා නුදුරු අනාගතයේ රාජ්‍ය සේවයට අවශ්‍ය කරන කළමනාකරණ, විද්‍යාත්මක සහ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම සහිත

ප්‍රවීණයන් රාජ්‍ය අංශයේ අදාළ ක්ෂේත්‍ර කෙරෙහි ආකර්ශණය කරගැනීම සඳහා සේවා නියුක්ති තත්ත්වයන් හි ඇති කළයුතු වෙනස්කම් ;

(ii) මීට ඉහත පත් කළ වැටුප් කොමිෂන් සභා නිර්දේශ අනුව හෝ එක් එක් අවස්ථාවන්හි දී කරනු ලැබුවා වූ හෝ වැටුප් වැඩිකිරීම් නිසා උද්ගතව ඇති දැනට පවත්නා වැටුප් විෂමතාවන් නිවැරදි කිරීමේ අවශ්‍යතාවය ;

(iii) රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද සේවා නියුක්තිකයන් තෘප්තිමත් වූත්, අභිප්‍රේරණය වූත්, අවශ්‍ය නිපුණතාවයන්ගෙන් සමන්විත වූත් පිරිසක් බවට පත්කිරීමේ අවශ්‍යතාවය ;

(iv) වඩාත් ඉහළ ඵලදායීතාවයක් හා කාර්යක්ෂමතාවයක් ලබාගැනීමට රාජ්‍ය සේවය මෙහෙයවීමේ අවශ්‍යතාවය මෙන්ම පෞද්ගලික අංශයේ ශ්‍රමබල අවශ්‍යතා සපුරාගැනීමට ඇති බාධක ඉවත් කිරීමේ අවශ්‍යතාවය ;

(v) රජයේ පුනරාවර්තන වියදම් ඉතා ඉහළ මට්ටමක මෙන්ම රජයේ ආයෝජන වියදම් පහළ මට්ටමක පැවතීමත්, රාජ්‍ය වියදම් වල ගුණාත්මකභාවය ඉහල නැංවීමේ අවශ්‍යතාවයත් සැළකිල්ලට ගනිමින්, ඉදිරිපත් කරන යෝජනාවලිය රජයේ අරමුදල් සීමාවන් තුළ ක්‍රියාත්මක කිරීම කළ හැකි බව ;

(ආ) දැනට පවතින වැටුප් හා වේතන, සේවක සංඛ්‍යාව හා සේවා තත්ත්වයන්, බඳවා ගැනීමේ පටිපාටි, උසස්වීම් පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු මෙන්ම වරින් වර කරනු ලැබ ඇති වැටුප් වැඩිකිරීම් නිසාවෙන් දැනට පැන නැගී ඇතැයි පෙන්වා දී ඇති විෂමතාවන් අවම කිරීම පිණිස රජයට යෝජනා ඉදිරිපත් කිරීම ;

(ඇ) සමාන වගකීම් දරන්නා වූ හෝ සමාන සුදුසුකම් සහිත වන්නා වූ හෝ වෘත්තිකයින් විසින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි දී ලබන්නා වූ වැටුප් හා වේතනයන් සහ දීමනා අතර ඇති විෂමතාවයන් වේ නම් ඒවා අවම කිරීම පිණිස මග පෙන්වන වැටුප් හා වේතන ව්‍යූහයක් පිළිබඳව රජයට යෝජනා ඉදිරිපත් කිරීම ;

(ඈ) ඇතැම් රජයේ ආයතන විසින් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන පාරිතෝෂික දීමනා ඇතුළු විවිධ දිරිගැන්වීමේ ක්‍රම හා ප්‍රදාන ක්‍රම සමාලෝචනයට ලක්කර පාරිතෝෂික දීමනා, විවිධ දිරිගැන්වීමේ දීමනා හා මූල්‍ය නොවන දිරිකාරකයන් ලබාදීම පිළිබඳව තීරණය කිරීම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමවේදයන් නිර්දේශ කිරීම ;

(ඉ) රාජ්‍ය සේවයේ පාරිශ්‍රමිකයන් සම්බන්ධයෙන් රජය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන වැටුප් සංශෝධනයන් හෝ ප්‍රතිපත්ති තීරණයන් අනුව, ඕනෑම රාජ්‍ය ආයතනයක හෝ ආයතනවල සහාය ලබාගනිමින් අවශ්‍ය පරිදි රාජ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි හෝ උසස්වීම් පටිපාටි සංශෝධනය හෝ ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඊ) රාජ්‍ය අංශයේ වැටුප් හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් ඇතිවන්නා වූ ආරවුල් කඩිනමින් සමථයකට පත්කිරීම අරමුණු කරගෙන එකී ආරවුල් නිරාකරණය කිරීමට අවශ්‍ය වන විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා අධිකාරී බලයක් ඇති ආයතනයක් (බේරුම්කරණ මණ්ඩලයක්) ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වර්ෂ දෙදහසක් වූ ජූලි මස විසිවන දින පත්කරන ලද වැටුප් කොමිෂන් සභාව විසින් කරනු ලැබ ඇති යෝජනාව ක්‍රියාත්මක කිරීම තව දුරටත් අධ්‍යයනය කර වැටුප් හා වේතන හෝ ඒ හා බැඳුණු මතභේද සම්බන්ධයෙන් ද බඳවා ගැනීම් පටිපාටි, උසස්වීම් පටිපාටි හෝ සේවා ව්‍යවස්ථා ආශ්‍රිත මතභේද සම්බන්ධයෙන් ද බේරුම්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම හා ඒවා සමථයකට පත්කිරීමේ ආයතනික ක්‍රමවේදයක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(උ) රාජ්‍ය සේවය වඩාත් අර්ථවත් හා ජනතා කේන්ද්‍රීය ආර්ථිකයකට අවශ්‍ය සේවා සැපයීම සැලකිල්ලට ගනිමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශය සඳහා තනතුරු ඇතිකිරීමේදී හා එම තනතුරු ක්‍රමවත් ලෙස බෙදී යන ආකාරය සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම ;

(ඌ) රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන වෘත්තීය සුදුසුකම් හා කුසලතා සහිත නිලධාරීන් අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි හෝ විදේශ රැකියා සඳහා නිරත වීමත් එමගින් රාජ්‍ය සේවය හැරයාම වළක්වනු පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(එ) අපේක්ෂිත ආයුකාලය වැඩිවීම නිසාත්, පවතින ජනගහනයේ සෞඛ්‍ය තත්ත්වයන් මෙන්ම ජාත්‍යන්තර ප්‍රවණතාද සැලකිල්ලට ගෙන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුළුල් සමාලෝචනයක් කර, ඉදිරි දශකයන්ට ගැලපෙන අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස් සීමාව හා සේවකයින්ගේ මානසික හා කායික සෞඛ්‍ය තත්ත්වයන් මෙන්ම ඵලදායී දායකත්වය පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඒ) පෞද්ගලික අංශයේ සේවක පිරිස් සඳහා සුනිසි අවම වැටුපක්, නිපුණතා වැඩිකරලීම, රැකියා සුරක්ෂිතතාව සහ ඔවුන්ට හිමිවිය යුතු අත්‍යාවශ්‍ය සුබසාධක පහසුකම් ලැබෙන බව සහතික කරවීමත්, පෞද්ගලික අංශයේ ඵලදායීතාවය තහවුරු කිරීම ජාතික ආර්ථිකය ශක්තිමත් මෙන්ම සේවක අභිවෘද්ධිය සඳහා වූ "සෞභාග්‍යයේ දැක්ම " ප්‍රතිපත්ති ප්‍රකාශයේ අන්තර්ගත රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඔ) රටේ ශ්‍රම සම්පත රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය විසින් රටේ සංවර්ධනය සඳහා ප්‍රශස්ත අයුරින් උපයෝගී කරගැනීමට අදාළ වන පරිදි ජාතික වැටුප් ප්‍රතිපත්ති රාමුවක් සඳහා රජයට යෝජනා ඉදිරිපත් කිරීම;

යන කරුණු පිළිබඳව රජයට උපදෙස් ලබාදීම සහ සහායවීම පිණිස ජාතික වැටුප් කොමිෂන් සභාවක් (මෙහි මින්මතු කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන) ස්ථාපනය කරලීම රජයේ අපේක්ෂාව වන හෙයින් ද,

තවද, ඉහතින් හඳුනාගෙන ඇති පරිදි, තත් කොමිෂන් සභාව වෙත පවරනු ලබන කාර්යයන් හා වගකීම් සපුරාලීම මහජන සුබසිද්ධිය උදෙසා වහාම ආරම්භ විය යුතුයැයි මා අදහස් කරන හෙයින් ද,

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂවන මම, පූර්වෝක්ත කාර්යයන් හා වගකීම් භාරගෙන ඉටුකරලනු පිණිස ජාතික වැටුප් කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙයින් පිහිටුවමි.

තවද, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි දැඩි විශ්වාසයෙන් යුතුව මෙමගින් පෙරකී,

01. උපාලි විජේවීර මැතිතුමා
02. චන්ද්‍රානි සේනාරත්න මැතිතුමිය
03. ගෝඨාභය ජයරත්න මැතිතුමා
04. සුජාතා කුරේ මැතිතුමිය
05. මධුරා වේහැල්ල මැතිතුමිය
06. එම්.එස්.ඩී. රනසිරි මැතිතුමා
07. වෛද්‍ය ආනන්ද හපුගොඩ මැතිතුමා
08. මහාධිකරණ විනිසුරු සංජීව සෝමරත්න මැතිතුමා
09. අජිත් නයනකාන්ත මැතිතුමා
10. රවී ලියනගේ මැතිතුමා
11. සනත් එදිරිවීර මැතිතුමා
12. මහාචාර්ය රංජිත් සේනාරත්න මැතිතුමා
13. ඉංජි. ආර්.එම්. අමරසේකර මැතිතුමා
14. විශ්‍රාමික මේජර් ජෙනරාල් සිරි රණවීර මැතිතුමා
15. ඩබ්ලිව්.එච්. පියදාස මැතිතුමා

වන ඔබතුමන්ලා ජාතික වැටුප් කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් මවිසින් මෙයින් පත්කරනු ලබන අතර, ඉහත (අ) සිට (ඔ) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් මම ඔබට මෙයින් විධානය කරමි.

තවද, උපාලි විජේවීර මැතිතුමා මෙම කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ද , චන්ද්‍රානි සේනාරත්න මැතිතුමිය කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද මම තවදුරටත් මෙයින් පත්කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට කොමිෂන් සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තවද රාජ්‍ය අංශයේ සුවිශේෂී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් හා පෞද්ගලික අංශය සම්බන්ධයෙන්, එකී කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජික මණ්ඩලයට අවශ්‍ය අවස්ථාවන්හි දී සහාය ලබාගනු පිණිස අදාළ කාර්යයට සීමාවන පරිදි ඒ ඒ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් හා පළපුරුද්දක් සහිත නිලධාරීන් තිදෙනෙකු බැගින් සමන්විත වන අනුකමිටු පත්කිරීමට කොමිෂන් සභාව වෙත මෙයින් බලය පවරමි.

කොමිෂන් සභාව විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් එම කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතුයැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධාන කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව ප්‍රකාරව වර්ෂ දෙදහස් දහනවයක් වූ මාර්තු මස 18 දිනැති ජනාධිපති විධානය හා ඊට වරින් වර කරන ලද සංශෝධන මගින් පිහිටුවන ලද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මෙයින් අහෝසි කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විස්සක් වූ පෙබරවාරි මස 14 වැනි දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී.බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

02 - 671

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.